එක්තරා ගම්බද පළාතක ගොවිරාල කෙනෙකුගේ ගෙදරක් තිබුණා. ගොවිරාල තමන් වගා කර ලැබූ දේ බූරුවෙකුගේ පිට උඩ තියාගෙන ගිහින් වෙළඳාම් කරනවා. හැන්දෑවට බූරුවා ලිහලා නිදැල්ලේ ඉන්න හරිනවා.


(C) Sumitha Publishers

හැන්දෑවට වඳුරෝ රංචුවක් ගහෙන්
ගහට පැන පැන යන ගමන් ගොවිරාලගේ
ගෙදර වහළයටත් පනිනවා.
වහළය උඩ එහාට මෙහාට පනිනවා;
ඉඳගෙන ඉන්නවා; ඇඟ කසනවා.
ගෙදර ඉන්න අය ඇවිත් මේ වඳුරන්
දිහා බලන් ඉන්නවා.
හිනාවෙලා සතුටු වෙනවා.

(C) Sumitha Publishers

